| 3 වන වාර පරීක්ෂණය - 2009 | |
|---|---|
| | |
| ඉතිහාසය | කාලය පැය 2 යි |
| නම:.................................................................... ශ්‍රේණිය............... අංකය................. | |

- **සැළකිය යුතුයි : මකන දියර භාවිතය සම්පූර්ණයෙන් තහනම් වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **I පත්‍රයේ දී ඇති සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **II පත්‍රයේ පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. (අ) හා (ආ) උප කොටස් වලින් ප්‍රශ්න එක බැගින්වත් අවම ලෙස තෝරාගෙන ප්‍රශ්න 4ට පිළිතුරු ලියන්න. පිළිතුරු ලිවිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.**

## I පත්‍රය

**1. නිවැරදිව පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය ගොඩනැගුනේ පහත දැක්වෙන කුමන ගංගා නිම්න ආශ්‍රිතවද ?
   (i) යුප්‍රටීස් - ටයිග්‍රීස් ගංගා නිම්න　(iii) සින්ධු ගංගා නිම්නය
   (ii) නයිල් ගංගා නිම්නය　(iv) හොවැංහෝ ගංගා නිම්නය

2. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් නගර දෙකකි.
   (i) මෙම්පිස් හා තිබ්ස්　(iii) මෙහෙන්ජෝදාරො හා හරප්පා
   (ii) කීෂ් හා නිප්පූර්　(iv) පිකිං හා අන්යාන්

3. වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ,
   (i) හිපොක්‍රටීස්වය　(iii) ටොලමිය
   (ii) යුක්ලීඩ්මය　(iv) ඩිමෝකැටිස්වය

4. මුහුම්මද් නබි තුමා මක්කම සිට මදිනා නගරයට පලායාම හඳුන්වන්නේ,
   (i) හජ්රා නමිනි　(iii) රාමසාන් දිනයයි
   (ii) තෛපොංගල් ලෙසය　(iv) දීපවාලි උත්සවයයි

5. සේන ගුත්තික යන අශ්ව වෙළෙඳුන් දෙදෙනා අනුරාධපුර රාජධානියේ බලය අල්ලා ගන්නා විට එවකට එහි සිටි පාලකයා නම්,
   (i) අසේල රජතුමා　(iii) වළගම්බා රජතුමා
   (ii) සුර තිස්ස රජතුමා　(iv) V වන මිහිඳු

6. බුදල්නාගේ ආධාරයෙන් 1055 දී රුහුණේ රජ වූයේ,
   (i) මහා පරාක්‍රම බාහු රජ්ජය　(iii) නිශ්ශංක මල්ල රජ්ජය
   (ii) මහා විජය බාහු රජ්ජය　(iv) 6 වන පරාක්‍රම බාහු රජ්ජය

7. "මාගේ රාජ්‍යයේ අහසින් වැටෙන එක දිය බිඳකුද, ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙමි" මෙම ප්‍රකාශය කළ රජතුමා,
   (i) මහ පරාක්‍රම බාහු රජ
   (ii) උදය රජ
   (iii) විජය බාහු රජ
   (iv) නිශ්ශංකමල්ල රජ

8. පළමුවන පරාක්‍රම බාහුගේ බිසව,
   (i) ලීලාවතී රැජිනය
   (ii) කල්‍යාණිවතී රැජිනය
   (iii) මිත්තා කුමරියයි
   (iv) සුගලා බිසවය

9. රෝම අධිරාජ්‍යයා වීමට ක්‍රිස්තියානින්ගෙන් සහය පැතූ රෝම පාලකයා වූයේ,
   (i) නීරෝය
   (ii) කොන්ස්ටන්ටයින්ය
   (iii) තියඩෝසියස්ය
   (iv) ඔගස්ටස් සීසර්ය

10. අවසාන වරට ලංකාව එක්සේසත් කළ රජතුමාව හඳුන්වනු ලබන්නේ,
   (i) හතර වන බුවනෙක බාහු ලෙසය
   (ii) හතර වන පරාක්‍රම බාහු ලෙසය
   (iii) හයවන පරාක්‍රම බාහු ලෙසය
   (iv) අටවන පරාක්‍රම බාහු ලෙසය

**2. පහත දැක්වෙන 11 - 15 දක්වා ප්‍රකාශන හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) වැරදි ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.**

11. ප්‍රථමයෙන් ම ග්‍රීසියට සංක්‍රමණය වූ ආර්ය ගෝත්‍රික ජනතාව කුඩාගම් වශයෙන් ජනවාස පිහිටුවා ගත්හ. ☐

12. ඇතැන්ස් රාජ්‍යයට අධිපති ඇතීනා දෙවගන වෙනුවෙන් පාතිනන් දෙව්මැදුර ඉදිකර ඇත. ☐

13. ප්‍රජාතන්ත්‍රවාදයේ මුල්බිම ලෙස සැලකෙන්නේ ඇතැන්ස් පෞර රාජ්‍යයයි. ☐

14. ග්‍රිකයන් විසින් ශ්‍රී ලංකාව හඳුන්වනු ලැබුවේ තැප්‍රොබේන් නමිනි. ☐

15. ඉතිහාස ග්‍රන්ථ රචනා කළ සොක්‍රටීස් ඉතිහාසයේ පියා ලෙස සැලකේ. ☐

**3. 16 - 20 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(ජුලියස් සීසර්, ඔගස්ටස් සීසර්, නිරෝ, ඉතාලි, තුර්කි, සාමිවරුන්, කොන්සල් වරුන්)

16. රෝම සමූහ ආණ්ඩු පාලන රටාව තුළ වැඩි බලයක් හිමිවූයේ ....................................................... නමින් හැඳින්වූ නිළධාරීන් දෙදෙනෙකුටය.

17. රෝම නගරය පිහිටා ඇත්තේ මධ්‍යධරණී මුහුදට නෙරා ගොස් ඇති ....................................................... අර්ධද්වීපයේ වෙරළ ආසන්නයේය.

18. ක්‍රි.පූ. 59 - 44 දක්වා රජ කළ .................................................. රෝමයේ කීර්තිමත් අධිරාජයා ලෙස සැලකේ.

19. රෝමය ගිනි ගනිද්දී ............................................ අධිරාජයා වීණා වාදනය කළේය.

20. ජේසු උපත සිදුවූයේ ................................................ ගේ පාලන සමයේදීය (2x20=40)

# <u>II පත්‍රය</u>

## <u>(අ) කොටස</u>

**1) තුන්වන වාරයේ ඔබ විසින් කරන ලද ඇගයීම පදනම් කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඔබ **'මධ්‍යතන යුගය'** හා **'රාජධානි විතැන් වීම'** පිළිබඳ පාඩම් වලින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනකට සහභාගි විය.

1. ඔබගේ කණ්ඩායමට පැවරූ මාතෘකාව කුමක්ද ?

   .................................................................................................................................. (3)

2. අනිවාර්යය ඇගයීමෙන් රැස් කර ගත් කරුණු මත පහත දී ඇති වගුව පුරවන්න.

| රාජධානිය | එහි රජ කල රජවරු |
|---|---|
| දඹදෙණිය | I. |
| යාපහුව | II. |
| කෝට්ටේ | III. |

(3)

3. ඉහත ඇගයීමට කරුණු සෙවීමට යොදාගත් මූලාශ්‍ර 2 ක් ලියන්න.

   1. ..................................................................................................
   2. ..................................................................................................

(4)

4. මෙම ඇගයීම ඉදිරිපත් කිරීම තුලින් ඔබ ලබාගත් වැසි 2 ක් ලියන්න.

   1. ..................................................................................................
   2. ..................................................................................................

(2)

5. මෙම ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේදී ඔබ මුහුණ දුන් ප්‍රශ්න 2 ක් ලියන්න.

   1. ..................................................................................................
   2. ..................................................................................................

(4)

## (ආ) කොටස

**2)**

(i) පැරණි ශිෂ්ටාචාර ගංගා නිම්න ආශ්‍රිතව බිහිවීමට හේතු 4 ක් ලියන්න.

(ii) ග්‍රීසියේ විසූ දාර්ශනිකයන් තිදෙනෙකුගේ නම් ලියන්න.

(iii) ආරබි ජාතිකයන් ලංකාවෙන් රැගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය 4 ක් ලියන්න. (11)

**3)**

(i) වෛදික සාහිත්‍යයේ වේද ග්‍රන්ථ 4 ලියන්න.

(ii) භාරතීය සමාජයේ (ඉන්දියාවේ) පැවති චතුර් වර්ණ නම් කරන්න.

(iv) මිසර ශිෂ්ටාචාරයේ පැවති කර්මාන්ත 3 ක නම් ලියන්න. (11)

**4)**

(i) කුරුස යුද්ධ යනු කුමක්දැයි ලියා දක්වන්න.

(ii) වැඩ වසම් ක්‍රමයේ පරිහානියට හේතු 3 ක් ලියන්න.

(v) වැඩ වසම් ක්‍රමයේ ආර්ථික ලක්ෂණ 4 ක් ලියන්න. (11)

## (ඇ) කොටස

**5)**

(i) මහා පරාක්‍රම බාහුගෙන් සිදුවූ සේවාවන් 3 ක් ලියන්න.

(ii) පොළොන්නරු යුගයේ කාන්තා නායකත්වය ගත් 4 දෙනෙකු නම් කරන්න.

(iii) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට හේතු 4 ක් ලියන්න. (11)

**6)**

(i) රාජධානි නිරිත දිගට සංක්‍රමණය වූ ආකාරය පිළිවෙලින්  ලියා දක්වන්න.

(ii) රාජධානි නිරත දිගට මාරු වීමට බල පෑ හේතු 3 ක් ලියන්න.

(iii) වන්නි විජය බාහු ලෙස හඳුන්වන්නේ කාවද ? (11)

**7)**

(i) VI වන පරාක්‍රමබාහුගෙන් සිදු වූ සේවාවන් 3 ක් ලියන්න.

(ii) කුරුණෑගල යුගයේ ලියවුණු ග්‍රන්ථ 4 ක නම් ලියන්න.

(iii) දඹදෙණි යුගයේ ලියවුණු සාහිත්‍ය කෘති 4 ක් නම් කරන්න. (11)